# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.01.15 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ තිස් හතරවන (34) සභා වාරය 2021.01.15 වන දින පෙ.ව 10.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී. චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයශීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

කාර්යාලයේ සේවය කරමින් සිටියදී හදිසි රෝගී තත්ත්වයක් උත්සන්න වීමෙන් පසුගිය බදාදා දින රෝහල් ගත කරන ලද ආදායම් පරීක්ෂක තනතුරට දැනට මාස 02 කට පෙර අළුතින් පත්වී පැමිණි තිලිණි රාවතාවත්ත මහත්මියට කොරෝනා රෝගය වැළදී ඇති බවට තහවුරු වීමත් සමග එදින කාර්යාලයේ ඇති වූ කලබලකාරි තත්ත්වය හා එම මහත්මිය කාර්යාලයේ සේවයේ යෙදී සිටි කාලය තුළ ආශ්‍රය කරනු ලැබූ සියළුම නිලධාරීන් නිරෝධායන කටයුතුවලට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිත බැවින් අද දින ප.ව.2.30 ට යොදා තිබුණු ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීම අද දිනට පෙ.ව.10.00 ට හදිසියේ යොදා ගැනීමට සිදුවීම සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කර සිටින බවට

ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලද අතර, එම හදිසි දුරකථන පණිවිඩයට අනුව මෙම මොහොතේ සභා රැස්වීම සාර්ථක කර ගැනීමට පැමිණි සියළුම සභිකවරුන්හට ස්තුතිය පුද කර සිටින බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 01. <u>පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.</u>

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්, ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමන්ගේ සහ සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පසුගිය මස මහ සභා වාර්තාව සභා සම්මත කරන ලදි.

## 02. <u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

නැත

## 03.<u>සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම</u>.

නැත

## 04. <u>යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම</u>

නැත

## 05. <u>යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

### 5.1. <u>ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**යෝජනා අංක 01**

2018 වර්ෂයේ උපමාන පාදක සංවර්ධන වැඩසටහන යටතේ පළාත් සභා මන්ත්‍රිවරුන් විසින් ප්‍රතිපාදන වෙන් කර තෝරා ගත් පුද්ගලයින් සඳහා ද්‍රව්‍ය ආධාර ලබාදීමට අදාළ ලිය කියවිලි ඉදිරිපත් කළ ද ව්‍යාපෘති 06 ක් සඳහා ද්‍රව්‍ය ආධාර ලබාදීමට මුදල් මේ වන තෙක් එවා නොමැත. එම මුදල් ඉදිරියේදී ලැබෙනු ඇතැයි සිතා 2019, 2020 වර්ෂවල ගිණුම්වලට ද ඇතුළත් කරන ලදී. එහෙත් එම ව්‍යාපෘති 06 සඳහා වෙන් කරන ලද මුදල වන රු.90000/= ක මුදල පළාත් සභාව විසිරුවා හැරීම හේතුවෙන් ගෙවීමට හැකියාවක් නොමැති බව දන්වා අප වෙත ලිපියක් එවා ඇති බැවින්, ඉහත සඳහන් රු.90000/= ක මුදල අදාළ ලේඛනවලින් ඉවත් කර 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් කපා

හැරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ව්‍යාපෘති 6 සඳහා පළාත් සභාව විසිරුවා හැරීමත් සමග ප්‍රතිපාදන ලැබී නොමැති නිසා ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන දිගින් දිගට ම ලේඛනවල පැවතීම, වර්ෂ අවසාන ගිණුම් ගත කිරීමවලදී ගැටළු සහගත තත්ත්වයන් ඇතිවන නිසා මෙම ව්‍යාපෘති 06 සඳහා වෙන් කර ඇති රු.90000/= ක මුදල 2020 වර්ෂයේ අවසාන ගිණුමෙන් කපා හැර ලේඛනවලින් ඉවත් කර නිරවුල් කර ගැනීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල, කුඹුක්කන, ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් විසින් කුඹුක්කන ප්‍රදේශයේ ඇති බහුකාර්ය ගොඩනැගිල්ලේ ග්‍රාම නිලධාරි කාර්යාලය, සමෘද්ධි නිලධාරි කාර්යාලය, කෘෂි පර්යේෂණ නිලධාරි කාර්යාලය, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය හා මහජන පුස්තකාලය යනාදි අත්‍යාවශ්‍ය කාර්යාල රැසක් පිහිටා ඇති බැවින් ඒවායේ රාජකාරි ඉටු කර ගැනීම සඳහා පැමිණෙන ජනතාවට භාවිතා කිරීම සඳහා වැසිකිළි පද්ධතියක් සකස් කර දෙන ලෙස කුඹුක්කන ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉන් අනතුරුව කුඹුක්කන වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම ඉදිරියේදී ලැබීමට නියමිත ප්‍රතිපාදනයන් යටතේ සකස් කිරීමට පියවර ගනිමු බවට ගරු සභාපතිතුමා ඇතුළුව මහ සභා විසින් සාකච්ඡා කර තීරණය කර ගත් අතර, ඒ සඳහා මහ සභාවේ කිසිදු විරුද්ධත්වයක් ද ඉදිරිපත් නොවුණි.

**යෝජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියා සිදු කිරිම හා වාර සේවා සිදු කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී.

| අනු අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|
| 01 | PF 7419 ඩබල් කැබ් රථය වාර සේවා කිරිම | 19180.00 |
| 02 | 252-6330 කැබ් රථයට ටයර් 04 ක් දැමීම | 79880.00 |
| 03 | 252-6330 කැබ් රථය වාර සේවා සිදු කිරිම | 19225.00 |
| 04 | 252-6330 කැබ් රථයේ ඔල්ටනේටරය අළුත්වැඩියාව | 11150.00 |
| 05 | ZA – 5061 බැකෝලෝඩරයේ බූම් එක පාස්සා ප්ලේට් ගැසීම | 33300.00 |
| 06 | ZA – 5061 බැකෝලෝඩරයේ ටයර් මාරු කිරිම | 1100.00 |
| 07 | LL – 6980 ට්‍රක් රථයේ ටයර් දෙක දැමීම | 94550.00 |
| 08 | මාර්ග තලනයේ ඩීසල් හෝස් අළුත්වැඩියාව | 1650.00 |
| 09 | මාර්ග තලනයේ ඩීසල් පොම්පය අළුත්වැඩියාව | 292502.97 |
| 10 | GC 5148 ගිනි නිවන රථයේ කාබලේටරය අළුත්වැඩියා කිරිම | 9600.00 |
| 11 | RC 1112 ට්‍රැක්ටර් රථයේ ඩීසල් පිල්ටර් කරාමය අළුත්වැඩියාව | 3500.84 |
| 12 | RD 4488 ට්‍රැක්ටර් රථය ඕල්ටනේටරය අළුත්වැඩියාව | 4900.00 |
| 13 | RD 4488 ට්‍රැක්ටර් රථයේ පිටුපස ටයරය සඳහා ටියුබ් එකක් දැමීම | 2000.00 |
| 14 | 49-5301 ට්‍රැක්ටර් රථයේ වාර සේවා සිදු කිරිම | 15960.00 |
| 15 | 49-5301 ට්‍රැක්ටර් රථයේ ක්ලච් ප්ලේට්, පෙෂර් ප්ලේට් දැමීම | 28550.00 |
| 16 | 37-9430 ට්‍රැක්ටර් රථයේ ඉදිරිපස ජේන්ට් කිරිම, ආම් සවි කිරිම ඇතුළු අළුත්වැඩියා කටයුතු | 48650.00 |
| 17 | 37-9430 ට්‍රැක්ටර් රථයේ ගියර් බොක්ස් එකෙ හි අළුත්වැඩියා කටයුතු | 43750.00 |
| 18 | 37-9430 ට්‍රැක්ටර් රථයේ ටිපර් හෝස් එක අළුතින් සවි කිරිම | 6620.00 |
| 19 | RY 2510 ටේලරයේ 750X16 H LOAD TIRE දැමීම. | 29900.00 |

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙම යෝජනාවේ අනු අංක 09 යටතේ ඇති සභාව සතු මාර්ග තලනයේ ඩීසල් පොම්පය අළුත්වැඩියාව සඳහා ද රු.292502.97 ක මුදලක් වැයවී ඇත්තේ කෙසේ ද යන්න සභාව විමසා සිටින ලදී. ඉන් අනතුරුව කරුණු සොයා බලා අවබෝධ කර ගැනීමෙන් අනතුරුව පරිගනක ගත කිරිමේදී අතපසුවීමකින් මුද්‍රණය වී ඇති අතර, එම අනු අංක 09 යටතේ ඉදිරිපත් කර ඇති අයිතමය වෙනුවෙන් වැය වන මුදල රු.4600/= ක් ලෙස සංශෝධනය විය යුතු බවට ගරු සභාපතිතුමා සභාවට ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉහත සංශෝධනය සභාව පිළිගත් අතර, න්‍යායපත්‍රානුකූලව අංක 03 යෝජනාව යටතේ අනු අංක 09 යටතේ ඇති අයිතමයේ මිළ ගණන රු.4600/= ලෙස සංශෝධනය කරමින් මෙම යෝජනාවට අදාළ සියළුම වියදම් විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් වියදම් දැරීම සුදුසු බවට සභාව ඒකමතිකව තිරණය කරන ලදී.

**යෝජනා අංක 04**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ පහත සංවර්ධන කටයුතු සභා අරමුදලින් සිදු කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී.

I. ප්‍රාදේශිය සභා කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා කොම්පෝස්ට් සකස් කිරිමට කොන්ක්‍රිට් ඇතිරීමක් සකස් කිරිම. (දළ ඇස්තමේන්තුව රු . 250,000.00)

II. ඉවතලන කාඩ්බෝඩ්, ප්ලාස්ටික්, බෝතල් අපද්‍රව්‍ය ගබඩා කිරිමට 18’x40’ විවෘත කොටසක් සකස් කිරිම.(ප්‍රතිචක්‍රිය කළ හැකි) (දළ ඇස්තමේන්තුව රු . 400,000.00)

III. ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය සඳහා ඉන්ටර් ලොක් ගල් ඇතිරිම(කාපට් කිරිමට නියමිත මාර්ගවලින් ඉවත් කරන ලද) (දළ ඇස්තමේන්තුව රු . 500,000.00)

IV. ආදාහනාගාරයට 12’x16’ කාමරයක් ඉදිකර දීම(සේවකයන්ට රැඳී සිටීම සඳහා) (දළ ඇස්තමේන්තුව රු . 650,000.00)

මෙම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යෝජනාවට අදාළ ඉදිරිපත් කරන ලද අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු වගකිව යුතු නිලධාරින්ගේ අධික්ෂණය යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන්වලදී විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 05**

මොනරාගල , දුටුගැමුණු පාර, අංක 25/10 හි පදිංචි කේ.බී.සී.කේ.කේ.ගුණතිලක මහතා විසින් කුඹුක්කන පොදු වැසිකිළිය 2021 වර්ෂය සඳහා ටෙන්ඩර් මගින් ලබා ගෙන ඇති අතර, එය ඔහු හට කරගෙන යාමට නොහැකි බවත්, ටෙන්ඩර්පත අවලංගු කර දෙන ලෙස ලිඛිතව දන්වා ඇති බැවින්, එම ටෙන්ඩර්පත අවලංගු කිරීම හෝ සභා තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී මොහු විසින් මෙම ටෙන්ඩරය නැවත සභාවට භාරදීම සම්බන්ධයෙන් සාධාරණ හේතු දක්වා තිබේ ද යන්න ගරු සභාව විමසා සිටින ලද අතර, ඔහු අදාළ ගිවිසුම අත්සන් කර සභාව හා එකඟතාවයන්ට පැමිණ ඇත් ද යන්නත් සභාව විමසා සිටින ලදී.

එහිදී දැනට රටේ පවතින තත්ත්වයන් සමග මෙය ඉදිරියට කර ගෙන යෑම අසීරු බවට ටෙන්ඩර්කරු දන්වා ඇති බවත්, ඔහු මේ හා සම්බන්ධ බදු ගිවිසුම තවමත් අත්සන් කර නොමැති බවටත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම වැසිකිළිය ටෙන්ඩර් මගින් ලබා ගෙන ඇති මෙම බදුකරු මේ සඳහා අදාළ ගිවිසුම්පත අත්සන් කර නොමැති නම් ඔහු මෙම ටෙන්ඩරය නැවත සභාවට භාර දීමට එකඟතාවය පළ කර ඇත්නම් එම පළමු ටෙන්ඩරය අවලංගු කර නැවත දෙවන ටෙන්ඩර් ඉල්ලුම්කරු හට එය ලබාදීමට කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**යෝජනා අංක 06**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පල වැසිකිළිය 2021 වර්ෂය සඳහා පහත සඳහන් අවම ලංසු මුදල් යටතේ තෙවරක් ටෙන්ඩර් කරනු ලැබුව ද මෙම දේපල සඳහා ටෙන්ඩර් අයදුම්පත් කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්, මෙම දේපල සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් මහ සභාවේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බවට 2020.12.22 දින පැවති ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කර ඇති බැවින් ඒ සඳහා සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අවස්ථා තුනේදීම මේ සඳහා ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් වී නොමැති නම් 2021 වර්ෂය සඳහා සභාවේ සේවක මහතෙකු යොදවා නඩත්තු කිරිම් හා පිරිසිදු කිරිම් කටයුතු නිසි පරිදි සිදු කරමින් සභාව මගින් මුදල් අය කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06.ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව කල්දී ඇති යෝජනා අංක 03 හි අනු අංක 2 අයිතමය යටතේ 252-6330 කැබ් රථයට ටයර් 04 ක් දැමීම වෙනුවෙන් රු.79880/= ක මුදලක් වැය වන බවට ඉදිරිපත් කර තිබූ අතර, සභා වාර්තාව සමග යා කර ඇති 2020 දෙසැම්බර් මාසයට අදාළ වියදම් වාර්තාවේ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු යටතේ මෙම කැබ් රථය සඳහා එක් ටයරයක් ලබා ගැනීම සඳහා රු.79880/= මුදලක් වියදම් දරා ඇති බවට ඉදිරිපත් කර ඇති අතර, එහි අඩු පාඩුවක් පවතින බව ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රිතුමා පෙන්වා දෙන ලදී.

ඉන් අනතුරුව නැවත ඒ පිළිබඳව ද කරුණු සොයා බලා අවබෝධ කර ගැනීමෙන් අනතුරුව එක් ටයරයක් වෙනුවෙන් රු.79880/= ක් වියදම් වී ඇති බවට අතපසුවීමකින් වියදම් වාර්තාවේ මුද්‍රණය වී ඇති අතර සභාව සතු 252-6330 කැබ් රථයට ටයර් 04 ක් දැමීම වෙනුවෙන් රු.79880/= ක මුදලක් වැයවී ඇති බැවින්, ඒ ආකාරයට එය නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ 2020.12.01 දින සිට 2021.12.31 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව පිළිගැනීම සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව සුනිල් අරංගල ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරිම බැවින්, සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

### 7.1 ගරු සභාපති - ආර්.එම්.රත්නවීර මැතිතුමා

I. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දෙවන අදියර යටතේ කළ යුතු සංවර්ධන යෝජනා පිළිබඳ සාකච්ඡාවක් පසුගිය දිනක

කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමන්ගේ සහ පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ මූලිකත්වයෙන් පැවති අතර, එහිදී ප්‍රාදේශීය සභාවට ආදායම් උත්පාදනය කිරීම සඳහා සුදුසු යෝජනා සාකච්ඡා කළ අතර, එහිදී දෙවන අදියරය යටතේ මොනරාගල ප්‍රාදේශීය සභාවට වෙන්වන ප්‍රතිපාදන යටතේ නගරයේ අංග සම්පූර්ණ වැසිකිළි පද්ධතියක් සකස් කිරීම , සුපර් මාකට්එක ඉදිරිපිට වාහන නැවතුම් ස්ථානයක් සකස් කිරීම හා සභාව සතු ළමා උද්‍යානය වැඩිදියුණු කිරීම යන යෝජනා අනුමත වූ බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. එහිදී එම ප්‍රතිපාදනවලින් නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අසල විධිමත් කඩ පේළියක් සහ වැසිකිළි පද්ධතියක් සකස් කර සභාවට ආදායමක් ලැබෙන අයුරින් යම් වැඩපිළිවෙළක් අදාළ ස්ථානයේ සකස් කිරීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් හා අතුල කුමාරසිරි ගරු මන්ත්‍රීතුමන් විසින් අදහස් ප්‍රකාශ කර සිටින ලදී.

III. එහිදී ඉදිරියේදී ලැබීමට නියමිත දේශීය ණය ව්‍යාපෘතිය සහ LDSP ව්‍යාපෘතිය යටතේ බිබිල පාර, හුලංදාව හි ඇති ශරීර සුවතා උද්‍යානයේ ඇවිදින මංතීරුව හා අවශේෂී සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා පියවර ගන්නා බව ට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. එහිදී එම ප්‍රතිපාදන යටතේ නගරයේ පොදු සුසාන භූමියේ අඩුපාඩු සකස් කර සංවර්ධනය කිරීමට යෝග්‍ය බව ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන සුසාන භූමි සංවර්ධනය සඳහා යොදවා ගැනීමට නොහැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. නගරයේ බස් නැවතුම්පොළ ඇති නව කඩ කාමර 2021 වර්ෂයේ සිට බදු දී ඇති නිසා ඒ ඉදිරිපිට ගාල් කරනු ලබන බස් රථ නවතා තැබීමට රථ ගාල අනිවාර්යයෙන් ම සකස් කර දිය යුතු බැවින් නගරයේ පොළ ඉදිරිපිට රථ ගාල සකස් කිරීම ආරම්භ කළ යුතු අතර, දැනට එම ස්ථානයේ පවතින නිවාස තුනෙහි පදිංචිකරුවන් වෙනුවෙන් රුපියල් ලක්ෂ 15 බැගින් වියදම් කර සාප්පුවත්තේ නිවාස 03 ක් ඉදිකර ඔවුන්ට භාරදීමට කටයුතු කළ යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, නිවාස 03 ඉදිකර ඔවුන්ට භාර දීමෙන් අනතුරුව ඔරලෝසු කණුව ළඟ සිට පාර දෙපස අවිධිමත් ලෙස නවතා තබන වාහන නිසි අයුරින් නවතා තැබීම සඳහා වෙනත් ස්ථානයක් නියම කර නගරයේ පාර දෙපස NO PARKIN කර වෙළඳසැල් සඳහා බඩු ලබාදීමට එන වාහන සඳහා පමණක් ඇතුළු වීමට අවසර ලබාදී යම්කිසි විධිමත් ක්‍රමවේදයක් සකස් කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී. නොඑසේ නම් ඔත්තේ රෙට්ටේ ක්‍රමයට වාහන නැවතීමට හෝ සැලසුම් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

VI. අනතුරුව වැලියාය පුස්තකාලය පවතින ස්ථානයේ උද්‍යානයක් සකස් කර යම් විධිමත්භාවයක් ඇති කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීම වැදගත් බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

VII. ඒ වගේම සිරිගල පාරේ ඇති HHP සිනමා ශාලාව ආසන්නව සභාවට අයත් ඉඩමේ තට්ටු ක්‍රමයට හෝ කඩ පේළියක් සකස් කර බදු දීම සුදුසු බවට අතුල කුමාරසිරි ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

VIII. මොනරාගල ප්‍රාදේශීය සභාවට අදාළව අධිකරණයේ පවතින නඩු කටයුතු සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට සහ ඒ සඳහා සහභාගී වීමට යෝජිත අනිකුත් නිලධාරින්ට ආයතනයේ පවතින කාර්ය බහුලත්වය අනුව සහ ඒ ඒ අවස්ථාවල යෙදෙන නොවැලැක්විය හැකි හේතු මත

මෙම නඩු කටයුතුවලට සහභාගීවීමට අවශ්‍ය ඊට අදාළව රැස් කර ගත යුතු තොරතුරු අදාළ නීතිඥ මහතුන් මුණ ගැසී සාකච්ඡා කර අවශ්‍ය සහාය ලබා ගැනීම නියමිත වේලාවට සිදු කර ගැනීමට අපහසු වන අවස්ථා උදාවෙන බැවින්, එම කටයුතු සඳහා අවශ්‍ය මූලික කටයුතු එනම් අදාළ නීතිඥවරුන් මුණගැසී අදාළ තොරතුරු රැස් කර ගැනීම හා අනෙකුත් කටයුතු පූර්ණ කාලීනව සිදු කර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට නඩු කටයුතු පිළිබඳව හසල දැනුමක් ඇති සහ නිරන්තරයෙන් ආයතනය වෙත අවශ්‍ය සහාය ලබා දෙන සුගතපාල සිරිවර්ධන දිසානායක මහතා යොදවා ගැනිමට ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ එකඟතාවය විමසන ලදී.

IX. ප්‍රාදේශිය සභා නඩු කටයුතු වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවන්වලදී අදාළ නිතිඥවරුන් මුණ ගැසී ඊට අදාළ තොරතුරු රැස් කර ගැනීම සඳහා හා අවශ්‍ය සහයෝගය ලබා ගැනිමට අප කවුරුත් දන්නා හඳුනන අවංකව කටයුතු කරනු ලබන විශ්වාසනීය පුද්ගලයෙකු වන සුගතපාල සිරිවර්දන දිසානායක මහතාගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවන්වලදි ලබා ගැනිම සුදුසු බවත්, මේ සම්බන්ඳව පළාත් පාලන කොමසාරිස්තුමන්ට දන්වා යවා පූර්ණ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරියට මෙතුමන්ගේ සහයෝගය ලබා ගැනීම සුදුසු බවට තීරණය කරන ලදි.

2021 වර්ෂයේ පෙබරවාරි මස මහ සභා රැස්වීම් වාරය පෙබරවාරි මස 12 වන සිකුරාදා දින පැවැත්වීමට කටයුතු කරමු බවට සභාවේ එකඟතාවයෙන් යොදා ගන්නා ලදි.

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි ගරු උපසභාපතිතුමා, සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.12.00 ට පමණ අවසන් කරන ලදී.

2020.12.11 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ.......................................................................................................යෝජනාවෙන් සහ...........................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

➢ **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.